**කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02 - 2022**

------------------------------------------------------------------------------

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02 හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 02 හි II වගන්තියේ ආ.3 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ - අදියර 02 හි ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. යාපනය, වවුනියා, අනුරාධපුරය, මඩකලපුව,බදුල්ල, මොණරාගල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. තවද, තරඟකාරී සහ අලෙවිකළ හැකි භාණ්ඩ නිපදවීමට, වෙළඳපොළ අවශ්‍යතා සඳහා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය දෙසට ගමන් කිරීම යන කටයුතු සඳහා සුළු පරිමාණ ගොවීන්ට සහයවීම කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ -02 අදියර යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,175.88 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 64.87 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඊට අමතරව මහනුවර, අම්පාර, කිලිනොච්චිය සහ වවුනියාව යනාදී දිස්ත්‍රික්කවල කටයුතු ක්‍රියාත්මක කිරීමට යුරෝපා කොමිෂන් භාර අරමුදලින් රු.මිලියන 5,040 කට සමාන යුරෝ මිලියන 25 ක් ලැබී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණද පසුව 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 32.6 ක් වූ ලෝක බැංකුවේ/අයිඩීඒ හි ණය ශේෂය, වාර්තා කරන දිනට ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනයකර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ ව්‍යාපෘති වියදම් ශේෂය රු.මිලියන 5,827 කින් අවතක්සේරුවී තිබුණි. | 5,827 | ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදෙන අරමුදල්, නිකුත්කල දිනයේ පැවති විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කරනු ලබයි. එසේම, මුදල් ආපසු ගැනීම් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යාපෘතිය වෙත නිකුත් කරන ලද අරමුදල්, මුදල් ආපසු ගැනීමේදී පැවති විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කරනු ලබයි. | ව්‍යාපෘතිය විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සිදුකළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 756 සහ 757 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම සෑම වසරකම දෙසැම්බර් 15 හෝ ඊට ආසන්න දිනකදී සිදුකළ යුතුය. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නියමිත දිනට පත්කර නොතිබුණි. සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2022 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණක් සිදුකර නොතිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කර ඇති අතර ප්‍රධාන කාර්යාලය හැර අනෙකුත් සියලුම පළාත් සඳහා සත්‍යාපන කටයුතු සිදුකරන ලදී. වැඩ අධිකවීම හේතුවෙන් ඒ සඳහා සම්බන්ධ නොවීය. කෙසේ වෙතත්, කාර්යාලීය ගෘහ භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලබාදී ඇති බවත්, ඒවා අමාත්‍යාංශයෙහි පොත්වල ලේඛනගතකර ඇති බවත්, ව්‍යාපෘතිය වෙත ලබාදී ඇති වත්කම් සමීක්ෂණ මණ්ඩලය විසින් සත්‍යාපනයකර ඇති බවත් වාර්තා කිරීමට කැමැත්තෙමු. | මුදල් රෙගුලාසියෙහි දක්වා ඇති උපදෙස් වලට අනුගත විය යුතුය. |
| (ii) | මු.රෙ. 835 | ගොඩනැගිලි සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමකින් තොරව ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා ගොඩනැගිලි දෙකක් කුලී පදනම මත ගෙන තිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. | මුදල් රෙගුලාසියෙහි දක්වා ඇති උපදෙස් වලට අනුකූල විය යුතුය. |
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 පෙබරවාරි 07 දිනැති අංක 01/2022 දරන චක්‍රලේඛනය. | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. 2023 වර්ෂයේ තුන්වන කාර්තුවේ සිට විගණන කමිටු පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛනයෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛනය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC) මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් පමණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. සැළසුම්කළ පරිදි ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට සෑම උත්සහයක්ම ගත්තද, පාලනයකළ නොහැකි හේතූන් මත රැස්වීම් කිහිපයක් පැවැත්වීමට නොහැකි විය. | චක්‍රලේඛනයෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 5 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීම
(ආ) නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම (ඒටීඩීපී)
(ඇ) නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් සැපයීම
(ඈ) විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහය ලබාදීම
(ඉ) ව්‍යාපෘති කළමනාකරණය, නියාමනය සහ ඇගයීම

ව්‍යාපෘති ප්‍රදේශවල කෘෂි ඵලදායිතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ඒ අනුව ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ ගොවීන් ශක්තිමත් කිරීම, රැකියා නිර්මාණය, නවීන කෘෂිකර්මාන්තය වෙත තරුණයින් ආකර්ෂණය කරගැනීම වේ.ශ්‍රී ලංකා රජය විසින් ණය නියෝජිතායතනය වෙත පොළී ගාස්තු ලෙස එකතුව රු.මිලියන 302.9 ක් ගෙවා තිබුණද මූලික ව්‍යාපෘති අරමුණු පසුව වෙනස්වී තිබුණු බව නිරීක්ෂණය විය. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීම | (i) | 2021 මාර්තු 31 දින වන විටත් ආරම්භකර නොතිබුණු පොකුරු ව්‍යාපෘති 20 කින් සහ නියමු ව්‍යාපෘති 20 කින් සමන්විත පොදු ලැයිස්තුගත නොකළ සමාගම් බවට බවට පරිවර්තනය කිරීමට අපේක්ෂිත සමාගම් වෙත බෙදාහැරීමේ අරමුණින් රු.මිලියන 35 ක් වටිනා කාර්යාල උපකරණ මිලදීගෙන තිබුණි. මිලදීගත් භාණ්ඩ වලින් කොටසත් පමණක් ව්‍යාපෘතිය වෙත ලැබී තිබුණු අතර අදාළ ගිවිසුම්ගත පිරිවිතරයන්ට අනුකූලව ඉල්ලුම්කළ ප්‍රමාණයන් සපයා තිබෙද යන්න පරීක්ෂා කිරීමකින් තොරව සැපයුම් නොකළ භාණ්ඩ සඳහාද ගෙවීම් සිදුකර තිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ (පීඒඩී) 9(අ) වගන්තිය ප්‍රකාරව ගොවි සමාගම් (පොදු ලැයිස්තුගත නොකළ සමාගම්) වෙත කාර්යාලීය උපකරණ සැපයීම මගින් ව්‍යාපෘතියට සහාය විය හැක. ඒ අනුව, එම සමාගම් සඳහා රු.35,372,436 ක් වටිනා කාර්යාලීය උපකරණ මිලදී ගැනීමට තීරණයකර කරන ලදී. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් ගැනීම සඳහා ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ සඳහන් අරමුණු සමඟ අනුකූල වීමට පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | (ii) | 2023 ජුනි 30 වන විට, නියමු ව්‍යාපෘතිය සඳහා සමාගම් 21 ක් ලියාපදිංචිකර තිබූ අතර ඉන් සමාගම් 18 ක් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ආරම්භකර නොතිබුණි. තවද, සමාගම් 4 කට කාර්යාල පරිශ්‍ර නොතිබුණි. ඉදිරි වසර එක හමාර තුළ එම අරමුණු ඉටුකර ගැනීමට හැකිවේද යන්න විගණනයට ගැටළුසහගතය. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. ඇතැම් සමාගම් මේ වනවිටත් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ආරම්භකර ඇති අතර සෙසු සමාගම් සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරමින් සිටී. | ව්‍යාපෘතියේ මෙහෙයුම් කාලය තුළ අදාළ ඉලක්ක සපුරා ගැනීමට ප්‍රයත්න දැරිය යුතුය. |
| (ආ) | නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම | (i) | ගම්පොළ කුරුඳුවත්ත ප්‍රදේශයේ ස්ථාපිත වියළි මිරිස් වගා කරනු ලබන ප්‍රතිලාභීන් 300 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සඳහා රෝපණ ද්‍රව්‍ය සහ ගොවි උපකරණ ලබාදීම වෙනුවෙන් මධ්‍යම පළාත් ව්‍යාපෘති කාර්යාලය විසින් රු.මිලියන 168.2 ක මුදලක් වැයකර තිබුණි. ව්‍යාපෘතියට සහභාගී විය හැකි ගොවීන් සංඛ්‍යාව 177 ක් වීම හේතුවෙන් පුද්ගලයින් 123 දෙනෙකු සඳහා මිලදීගත් උපකරණ නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. මෙම පොකුර මිරිස් ගොවීන් 300 දෙනෙකුගෙන් යුක්තව පිහිටුවීමට සැළසුම්කර තිබුණි. ඒ අනුව සැළසුම්කළ වගාව සඳහා අවශ්‍ය යෙදවුම් මිලදී ගැනීමට කටයුතු කරන ලදී. ගොවීන්ට අදාළ යෙදවුම් වගා කරන අවස්ථාවේදී තිබිය යුතු බැවින් මෙසේ කිරීමට සිදුවිය. කෙසේ වෙතත්, රටේ පැවති ඉන්ධන හිඟය, රසායනික පොහොර හිඟය යනාදී තත්ත්වයන් හේතුවෙන් වගාව සඳහා ගොවීන් අධෛර්යමත් වීමට හේතු විය. කෙසේ වෙතත් මේ වන විට ගොවීන් 240 ක් පමණ වගාව සඳහා යොමු වී සිටී. | අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |
| | | (ii) | ව්‍යාපෘති යෝජනාවට අනුව, ගොවීන් 300 දෙනෙකු අක්කර භාගය බැගින් මිරිස් වගා කිරීමටත්, අක්කරයකට ටොන් 03 සිට ටොන් 450 ක් දක්වා වියළි මිරිස් නිෂ්පාදනය කිරීමටත්, කි.ග්‍රෑම් 1 ක් රු.600 බැගින් අලෙවි කිරීමෙන් රු.මිලියන 270 ක් උපයා ගැනීමටත් අපේක්ෂා කෙරේ. වගාවන් සිදුකර එම වගාව අත්හැර දැමූ මුළු ගොවීන් සංඛ්‍යාව 177 කි. ව්‍යාපෘතිය සඳහා ගොවීන් 123 දෙනෙකු දායක කර ගැනීමට නොහැකිවී තිබුණි. | ආරම්භක අවධියේදී ගොවීන්ගේ අඩු සහභාගිත්වයක් පැවති අතර මේ වන විට ගොවීන් 240 ක් වගාවේ නිරතව සිටින බවත් ඉදිරි කන්නයේදී එය තවදුරටත් වැඩි කරන බවටත් එකඟත්වය පළකර ඇත. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගත හැකි වන පරිදි ව්‍යාපෘතියේ කාර්යයන් සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | උතුරුමැද පළාත වැනි බහුලව මිරිස් වගා කරනු ලබන කඳුකර ප්‍රදේශයන්හි තැනිතලා ඉඩමක් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන්, හෙල්මළු ක්‍රමය නිසා වැසි ජලයෙන් හා ගංවතුරෙන් මිරිස් විනාශ වී ඇති අතර ස්ථාන කිහිපයකින් අක්කර භාගයක පමණ ඉඩමක් සොයා ගැනීමට සිදුවී තිබුණි. තවද, පොම්ප භාවිතය සහ බිංදු ජල සම්පාදන පද්ධතිය අක්‍රීය වී තිබුණි.කුරුඳුවත්ත ප්‍රදේශයේ මිරිස් වියළීමේ යන්ත්‍රයක් සවිකර තිබුණද, වියළීමේ යන්ත්‍රයට ළඟා වීමට මිරිස් රැගෙන යන ගොවීන්ට ගොවිපළේ සිට කි.මීටර් 13- 40 ක් පමණ දුරක් ගමන් කිරීමට සිදුවීම නිසා වියළීමේ යන්ත්‍රය භාවිතයද අසාර්ථකවී තිබුණි. | මෙම ප්‍රදේශයේ මිරිස් වගාව සඳහා සුදුසු වේ. මෙම වගාවෙන් දැනටමත් දෙවරක් අස්වනු නෙලා අවසන්ව ඇත. මිරිස් වගා කරන අනෙකුත් ප්‍රදේශය සම්බන්ධයෙන් ගත්කළ මෙම ප්‍රදේශය මිරිස් වගාවට සුදුසු වේ. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘතිය සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (iv) | ගොවීන් 300 දෙනෙකුට පමණ ගොවි උපකරණ ලබා දීමට සැළසුම්කර තිබුණු අතර ගොවීන් හඳුනා ගැනීමට පෙර රු.මිලියන 173 ක උපකරණ මිලදීගෙන තිබුණි. හඳුනාගත් ගොවීන් සංඛ්‍යාව 177 ක් වූ අතර ගොවීන් 123 දෙනෙකු සඳහා මිලදීගත් රු.මිලියන 71 ක ගොවි උපකරණ නිෂ්කාර්ය වී තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනයන් සඳහා එස්ටීර්පී හරහා ලෝක බැංකුවේ අනුමැතිය ලබාගතයුතු බැවින් සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය කළයුතු බැවින් ඒ සඳහා සැලකියයුතු කාලයක් අවශ්‍යවේ. ඊට අමතරව, වගා ක්‍රියාවලිය කන්නය තුළ ආරම්භ කළ යුතුය. මෙම තත්ත්වය තුළ ගොවීන් තෝරා ගැනීම අවසන් වනතුරු කෘෂි උපකරණ මිලදී ගැනීම ප්‍රමාද කළ නොහැක. බොහෝ ගොවීන් තෝරාගෙන කටයුතු ආරම්භකර ඇති බැවින් වත්කම් නිෂ්කාර්ය වීමේ ගැටළුවක් ඇති නොවේ. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘතිය සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (v) | ගොවීන් වෙත බෙදාහැරීම සඳහා මිලදී ගන්නා ලද ගොවි උපකරණ පිළිබඳ පරීක්ෂා කිරීමේදී, ගැල්වනයිස් බට (ජීඅයි) 213 ක අතිරික්තයක්, කෘමි ආවරණ දැල් රෝල් 177 ක හිඟයක්, ජල පොම්ප 139 ක හිඟයක්, ෆූට් වැල්ව් 07 ක හිඟයක්, තවාන් තැටි 12,105 ක හිඟයක් සහ මිරිස් බීජ කි.ග්‍රෑම් 2.8 ක හිඟයක් පැවතිණි. බීඩින් හා ස්පයිරල් ලැබීම් සහ නිකුත් කිරීම් | ඇතැම් ප්‍රතිලාභී ගොවීන් එම අවස්ථාවේ අදාළ උපකරණ භාර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අතිරික්තයක් ඇති වී තිබේ. කෙසේ වෙතත් එම වත්කම් ගොවීන් වෙත නිකුත්කර තිබේ. | ව්‍යාපෘති තොග ලේඛන සහ තොග සම්බන්ධයෙන් මු.රෙ. 751 ට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාකර නොතිබූ බැවින් හිඟයන් සහ අතිරික්තයන් හඳුනා ගැනීමට නොහැකි විය. | | |
| (vi) | භෞතිකව පරීක්ෂා කරන ලද වගා බිම් 20ක් අතුරින් එක් බිම් කැබැල්ලක් හැර ඉතිරි වගා බිම් 19 හි ගොවීන් ව්‍යාපෘතියෙන් ලබා දුන් භාණ්ඩ භාවිතාකර නොතිබුණි. එම වගා බිම් 19 ගංවතුර, වර්ෂාව හෝ ශීත කාලගුණය හේතුවෙන් අසාර්ථක වී තිබුණි. | භාවිතයට නොගත් උපකරණ ගොවීන්ගෙන් ආපසු ලබා ගැනීමට කටයුතුකර ව්‍යාපෘතියට සම්බන්ධ වීමට කැමති නව ගොවීන් වෙත නැවත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාර්යයන් සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (vii) | යුරෝපා සංගමයේ ආධාර මත ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 90 ක් වූ දෙමුහුන් බඩඉරිඟු බීජ ව්‍යාපෘතිය බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රදේශයෙන් ආරම්භකර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ගොවීන් 50 දෙනෙකු සහ ගොවීන් සතු කුඹුරු අක්කර 50 ක් තෝරාගෙන තිබුණි. ව්‍යාපෘති නිර්ණායකයන්ට අනුව ගොවීන් තෝරා නොගැනීම, නිවැරදි වගා බිම් තෝරා නොගැනීම, වගා බිමට සුදුසු බීජ හඳුනා නොගැනීම සහ නියමිත කාලය තුළ බීජ, පොහොර හා කෘෂි රසායන ලබා නොදීම යනාදිය හේතුවෙන් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථකවී තිබුණි. ඒ සඳහා වැය වූ රු.මිලියන 2.67 ක වටිනාකම නිෂ්කාර්ය වියදමක් වී පැවතිණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. මෙම ප්‍රදේශය බඩඉරිඟු වගාවට ප්‍රසිද්ධ බැවින් හා උපදේශකවරුන්ගේ නිර්දේශ පරිදි කන්දකැටිය ප්‍රදේශයේ දෙමුහුන් බඩඉරිඟු නිෂ්පාදන පොකුරු ආරම්භ කරන ලදී. මෙම පොකුරු අම්පාර දිස්ත්‍රික්කය වෙත මාරු කිරීමට දැනටමත් තීරණයකර ඇත. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාර්යයන් සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (viii) | ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 32 ක් වූ සහ ප්‍රතිලාභීන් 100 දෙනෙකුගෙන් සමන්විත මුරුංගා ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28.4 ක් වැයකර තිබුණද, මුරුංගා බීජ ලෙස දේශීය ප්‍රභවයන් වෙනුවට විදේශීය ප්‍රභවයන් යොදා ගැනීම හේතුවෙන් මුරුංගා වගාව අසාර්ථක වී තිබුණි. ඒ අනුව ඒ සඳහා වැයකළ රු.මිලියන 28.4 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. කොවිඩ් තත්ත්වය, ගොවීන්ගේ ආකල්ප, ආර්ථික පරිසරය හේතුවෙන් ව්‍යාපාරවල ඇතිවූ දුර්වලතා යනාදිය වැල්ලවායේ මුරුංගා වගාව අසාර්ථක වීමට ප්‍රධාන වශයෙන් හේතුවිය. ගොවීන් ක්‍රමක්‍රමයෙන් අනෙකුත් අන්තර් බෝග සමඟ මුරුංගා වගාවේ නිරතවෙමින් සිටින බව වාර්තා වේ. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාර්යයන් සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ix) | මිරිස් සඳහා වූ පොකුරු ගම්මාන වැඩසටහන යටතේ ගොවීන් වෙත බෙදාදීම සඳහා ගැල්වනයිස් කරන ලද පයිප්ප 11,600 ක් උතුරුමැද පළාත් ව්‍යාපෘති කාර්යාලය විසින් මිලදීගෙන තිබුණි. ඒ අතරින් භාණ්ඩ ලැබීමේ සටහන් පත්‍ර (ජීආර්එන්) අනුව ලැබී ඇත්තේ ගැල්වනයිස් කරන ලද පයිප්ප 9,600 ක් පමණි. ගැල්වනයිස් කරන ලද පයිප්ප 2,000 ක් ගබඩාවට ලැබී නොතිබුණු අතර එම පයිප්ප 2,000 සඳහා මුදල් ගෙවා තිබුණි. | සම්පූර්ණ ගැල්වනයිස් කරන ලද නල ප්‍රමාණය සැපයුම්කරු විසින් ලබාදී ඇත. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාර්යයන් සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතු අතර ව්‍යාපෘති තොග ලේඛන සහ තොග සම්බන්ධයෙන් මු.රෙ. 751 ට අනුකූල විය යුතුය. |
| (x) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද බිම්මල්, කෝමාරිකා, මුරුංගා සහ කරවිල යනාදී නියමු ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් පිළිවෙලින් රු.මිලියන 13.517, රු.මිලියන 23.77, රු.මිලියන 32.497 සහ රු.මිලියන 11.9 ක් වේ.<br>ඒ අනුව මුළු වියදම රු.මිලියන 81.7 ක් වේ. කෙසේ වෙතත්, එම නියමු ව්‍යාපෘති සියල්ලටම සම්බන්ධ ගොවීන් නිසි තාක්ෂණය සහ වෙළඳපොළ නොමැතිකම හේතුවෙන් ගොවිතැන් කටයුතු වලින් ඉවත්වී ඇත. ඒ අනුව උක්ත ගොවිතැන් සඳහා දරන ලද වියදම් නිෂ්කාර්යව පැවතුණි. | බිම්මල් වගාව මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. කොවිඩ් සමයේදී කෝමාරිකා සඳහා ගැනුම්කරුවන් සොයා ගැනීමට නොහැකිවූයේ ගොවීන් මෙම වගාව සඳහා අධෛර්යමත් වූ බැවිණි. කෙසේ වෙතත්, කෝමාරිකා සඳහා විකල්පයක් ලෙස පැෂන් වගා කිරීමට දැනටමත් කටයුතු සිදුකර ඇත. | ව්‍යාපෘති කාර්යයන් නිසි පරිදි සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතිය 2017 ජනවාරි 17 වන දින ආරම්භකර ඇති අතර අධීක්ෂණ තොරතුරු පද්ධතිය (එම්අයිඑස්) නිර්මාණය කිරීම සඳහා 2018 නොවැම්බර් 15 දක්වා මාස 22 ක පමණ කාලයක් ගතවී තිබුණි. 2018 නොවැම්බර් 15 වන දින, රු.මිලියන 8 ක වටිනාකමකට පෞද්ගලික සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ලබා දී ඇති අතර කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව අත්සන් කරන ලද දින සිට මාස 03 ක් ඇතුළත ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණ අධීක්ෂණ තොරතුරු පද්ධතියක් (එම්අයිඑස්) ලබාදිය යුතු | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ.<br>කෙසේ වෙතත්, 2022 සිට පළාත් ක්‍රියාකාරී සැළසුම් ඇතුළත් කිරීමට පළාත් විසින් කටයුතුකර ඇති අතර ඒ අනුව, ඔවුන් සිය වැඩසටහන් යාවත්කාලීන කරන ලදී. වෙනත් මැදිහත්වීම් හේතුවෙන් මෙම කාර්යයට සහභාගී වීමට පළාත් කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. ඒ අනුව සෑම දිස්ත්‍රික්කයක් සඳහාම කොන්ත්‍රාත් පදනම මත සමාජ හා පාරිසරික නිලධාරීන් බඳවා ගැනීමට ව්‍යාපෘතිය විසින් තීරණය කරන ලදී. ඔවුන්ට පවරා ඇති කර්යයන්ට අමතරව අධීක්ෂණ තොරතුරු පද්ධති නිතිපතා යාවත්කාලීන කිරීමද | නියමිත කාල සීමාව තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | බව සඳහන් වී තිබුණි. මෙම තොරතුරු පද්ධතියට 2022 දෙසැම්බර් වන තෙක් සම්පූර්ණයෙන් නිමකර නොතිබුණු අතර ඒ සඳහා දරන ලද රු. මිලියන 5 ක වියදම නිෂ්කාර්යව පැවතුණි. | ඔවුන්ට පැවරී ඇත.<br>මෙම වැඩපිළිවෙලෙහි ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂය සඳහා වූ පළාත් ක්‍රියාකාරී සැළසුම් පද්ධතිය වෙත යාවත්කාලීන කරමින් පවතී. තවද, ප්‍රතිලාභීන්ගේ දත්ත ඇතුළත් කිරීම සම්පූර්ණ කිරීම සඳහා ඔවුන්ට ඉලක්ක ලබාදී ඇත. | |
| (ආ) | නිසි සැළසුමකින් තොරව නිශ්චිත කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම සහ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය එක්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් ඇතිකරගෙන තිබුණද ඒවා ව්‍යාපෘති දෙකක් ලෙස ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට පෙර නිම කිරීමට නියමිතව තිබූ රු.මිලියන 517 ක් වටිනා ව්‍යාපෘති 22 ක භෞතික ප්‍රගතිය සියයට 0 සිය සියයට 50 දක්වා පරාසයක පැවතුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | සැළසුම්කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතුය. |

**3.3 ඌන උපයෝජිත සම්පත්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයේ අයවැය දායකත්වය රු.මිලියන 40 ක් වූ අතර ව්‍යාපෘතිය විසින් රජයේ අරමුදලින් භාවිතාකර ඇත්තේ රු.මිලියන 8.9 ක් වන අතර එය එකඟ වූ මුදලින් සියයට 23 කට සමානවේ. ඒ අනුව සියයට 77 ක් ව්‍යාපෘතිය සඳහා භාවිතාකර නොතිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ.<br>ශීර්ෂ අංක 118-02-03-39-2507(17) යටතේ එකතුව රු.මිලියන 40 ක මුදලක් රජ්‍ය ආයතන වලට සහ රජයේ නිලධාරීන්ට අදාළ ගෙවීම් කිරීම සඳහා ලබා දී ඇත. ගෙවීම් වලින් වැඩි ප්‍රමාණයක් ණය/ප්‍රදාන අරමුදල් යටතේ සිදුකර ඇති අතර රටෙහි අයවැය තත්ත්වය සහ රාජ්‍ය මූල්‍ය සීමාවන් සැලකිල්ලට ගෙන මෙම ප්‍රතිපාදන යටතේ වියදම් අවම මට්ටමක පවත්වා ගැනීමට සෑම උත්සාහයක්ම දරන ලදී. | සැළසුම්කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළයුතුය. |
| (ආ) | තොරතුරු වලට අනුව, ව්‍යාපෘතියේ ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 6.2 ක් හෙවත් රු.මිලියන 904.89 ක් වෙන්කර තිබුණි. මෙම මුදලින් රු.මිලියන 132 ක් 2022 සැප්තැම්බර් වන විට වියදම්කර තිබුණි. ගොවි ආශ්‍රිත නිෂ්පාදන සංගම් ඇති කිරීම මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණ වී තිබුණි. පුහුණුව අවසානයේ ව්‍යාපාති | ගොවීන් පුහුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරේ. අයිඑස්පී වැඩසටහන යටතේ ඇතැම් නියමු ව්‍යාපෘති පුළුල්කර ඇත. තවද, නියමු ව්‍යාපෘති සඳහා පොදු ලැයිස්තුගත නොකළ සමාගම් 21 ක් ස්ථාපිත කරන ලදී. | සැළසුම්කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළයුතුය. |

නිලධාරීන් පොකුරු ව්‍යාපෘති වල ගොවීන් සමඟ සම්බන්ධතා සහ නිරීක්ෂණ කටයුතු වලින් ඉවත්වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගොවීන් මෙම ව්‍යාපෘතියේ නියමු කණ්ඩායම් වලින් ඉවත්ව තිබූ අතර ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන සඳහා දරන ලද රු. මිලියන 132 ක මුදල නිෂකාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

**3.4 මතභේදාත්මක ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ප්‍රාදේශීය කාර්යාලය මගින් සිදුකරන ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. ජාතික තරඟකාරී ලංසු තැබීම (එන්සීබී) සහ වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය හරහා භාණ්ඩ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 අනුව සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි. මිලදී ගැනීම්වලට අදාළ ලිපිගොනුවල කාර්ය සාධන බැඳුම්කර පිළිබඳ තොරතුරු ඇතුළත් නොවූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 අනුව කාර්ය සාධන බැඳුම්කර හෝ කොන්ත්‍රාත් වටිනාකමෙන් යම් ප්‍රතිශතයක් රඳවා ගත යුතු නමුත් රු. මිලියන 473.378 ක වටිනාකම වූ කොන්ත්‍රාත් 11 කට අදාළව එවැනි රඳවාගැනීම් සිදුකර නොතිබුණි. එසේම එකඟ වූ ප්‍රමිතීන්ට අනුව භාණ්ඩ සැපයූ බවට හෝ පිළිගත් බවට ලියවිලි ප්‍රසම්පාදන ගොනුව තුළ නොතිබුණි. | කළමනාකාරිවය විසින් අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සිදුකළ යුතුය. |
| (ආ) | නාවලපිටිය මිරිස් වගා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමට පෙර ගොවීන් 300කට බෙදා දීම සඳහා උපකරණ මිලදී ගෙන තිබුණි. 2022 සැප්තැම්බර් මාසය අවසන් වන විට ගොවි සංවිධාන තුනක සහ කෘෂිකාර්මික මධ්‍යස්ථානයේ උපකරණ නොලැබුණු ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 86 කි. නිශ්චිත ගොවීන් සංඛ්‍යාව තෝරා තැනීමකින් තොරව පොලිතීන් ආවරණ රෝල් මිලදී ගැනීම හේතුවෙන් රුපියල් මිලියන 32.224ක් වටිනා පොලිතීන් ආවරණ රෝල් 380ක් මාතලේ නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතිණි. | කළමනාකාරිවය විසින් අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති කාර්යයන් නිසි පරිදි සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මඩකලපුව දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාවට සහ අම්පාර දිස්ත්‍රික්කයේ මිරිස් වගාවට අදාළ ගොවීන්ට බෙදා හැරීම සඳහා මිලදී ගත් රුපියල් මිලියන 178.4ක් වටිනා භාණ්ඩ සහ උපකරණ තොගයක් ගොවීන් වෙත බෙදා දී නොතිබුණි. එම භාණ්ඩ හා උපකරණ කලුදේවලි ආර්ථික මධ්‍යස්ථානයේ සහ වෙල්ලාන්දි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ කෝමාරි කෘෂිකර්ම මධ්‍යස්ථානයේ තිබුණි. | අදාළ වගාවන් මේ වන විට ආරම්භ කර ඇති අතර එහි සඳහන් උපකරණ බෙදාදීම සිදු කෙරෙමින් පවතී. | භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය රජයට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කළ යුතු අතර වත්කම් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | තලාව කෙසෙල් වගා ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 6 ක් වටිනා ජල විහිදුම් පද්ධති ලබාදීමේ සහ සවිකිරීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට ප්‍රථම වෘත්තීය දැනුම හා පළපුරුද්ද ඇති සුදුසු පුද්ගලයකු ලවා පිරිවිතර හා සැළසුම් සකස්කර සුදුසු අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතුය. එය විධිමත් ලෙස සිදු කළ බවට ලිඛිත සාක්ෂියක් නොතිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ එක් සාමාජිකයෙක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයෙක් අදාළ වාර්තාවලට අත්සන් නොකළ අවස්ථා ද දක්නට ලැබුණි. | ආනයන සීමා කිරීම හේතුවෙන් නිර්දේශිත වාරි මාර්ග පද්ධති ලබා ගැනීමට හැකියාවක් නොමැතිකම නිසා තලාව මිරිස් වගා පොකුර සඳහා භාවිතා කිරීමට තාවකාලික පියවරක් ලෙස විගණන වාර්තාවේ සඳහන් ජල විහිදුම් පද්ධතිය මිලදී ගැනීමට සිදුවිය. නිර්දේශිත එක් වාරි පද්ධතියක් මිලදීගෙන ඇති අතර, විකල්ප බෝගවල විකල්ප භාවිතයන් සඳහා ජල විහිදුම් පද්ධතිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත නිකුත්කිරීමට නියමිතය. | ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීමට පෙර, වෘත්තීය දැනුම හා පළපුරුද්ද ඇති සුදුසු පුද්ගලයෙකු මගින් පිරිවිතර සහ සැළසුම් සකස් කර සුදුසු අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතුය |
| (ඉ) | රු.මිලියන 23ක් වටිනා ඉලෙක්ට්‍රොනික් තරාදි 23ක් ප්‍රසම්පාදනය කිරීමේදී විධිමත් ඇස්තමේන්තුවක් සහ පිරිවිතර සකස්කර නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 2.14 වගන්තියට අනුව මිල ගණන් කැඳවා නොතිබුණි. තවද, ලංසු ඇපකරයක් හා වගකීම් කාලය පිළිබඳ ගිවිසුමකට එළඹීමට අපොහොසත් වීම සහ දේශීය නියෝජිතායතනවලින් මිල ගණන් ලබා නොගැනීම හේතුවෙන් දේශීය නියෝජිතයින්ගේ මිල ගණන් වලට වඩා රු.247,667 ක් ගෙවීමට සිදුවීමෙන් රජයට පාඩුවක් සිදුවී තිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි වල කාර්යක්ෂමතාවය සහ විනිවිදභාවය සහතික කළ යුතුය. |

**3.5 මානව සම්පත් කලමනාකරණය සම්බන්ධ ගැටළු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන කාර්යාලයේ (පීඑම්යූ) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර 2021 දෙසැම්බර් 16 සිට 2022 දෙසැම්බර් දක්වා පුරප්පාඩුව පැවති අතර වැඩබැලීමේ රාජකාරි කටයුතු සඳහා ව්‍යාපෘතියේ | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ.<br><br>පුරප්පාඩු වූ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ වැඩබැලීමේ කටයුතු කිරීම සඳහා අදාළ නිලධාරියා පත් කරන ලදී. උනන්දුවක් දක්වන | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතුකර ව්‍යාපෘතියේ ඉලක්ක සපුරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපත්ති විශේෂඥ තනතුර දරන නිලධාරියා පත් කර තිබුණි. එම කාලය තුළ වැඩ බලන දීමනා ලෙස දළ වශයෙන් රු.575,000ක් පමණ ගෙවා තිබුණි. | පාර්ශ්වයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබූ අතර, මෙම කාලය තුළ රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් බඳවා ගැනීම් සිදු කර නොමැත. තවද පුරප්පාඩු වූ ව්‍යාපෘති කාර්ය මණ්ඩල තනතුරු රාජ්‍ය නිලධාරීන්ගෙන් පිරවීමට රජය තීරණය කර ඇත. ඒ අනුව වැඩබලන පදනම මත පත්කළ නිලධාරියාට මෙම තනතුර සඳහා අමාත්‍යාංශයෙන් නිළධාරියෙකු මුදාහරින තෙක් දිගටම කටයුතු කිරීමට සිදු විය. ඒ අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් නිදහස් වූ නිලධාරියෙකු යොදා මෙම තනතුර සඳහා බඳවාගෙන ඇත. විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය ක්ෂේත්‍රයට වගකිව යුතු නිලධාරිනිය ඇයගේ වගකීම් ඉටු කර ඇති අතර, ඊට අමතරව, පාර්ශවකරුවන් සමඟ වසර තුළ ප්‍රතිපත්ති සමාලෝචනයකර ඇත. | |
| (ආ) | ප්‍රතිපත්ති විශේඥයා වෙත පවරා තිබූ ප්‍රධාන රාජකාරියවන විශ්ලේෂණ හා ප්‍රතිපත්ති උපදේශන සහාය ලබාදීම සහ ජාතික ප්‍රතිපත්තිය ලෙස ව්‍යාපෘතිය මගින් හඳුනාගත් ප්‍රතිපත්ති ප්‍රකාශ කිරීම හා අවශ්‍ය අනුපූරක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම 2022 දෙසැම්බර් වන විටත් අවසන්කර නොතිබුණි. අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ගිවිසුම සකස් කිරීමට රු.මිලියන 65.58 ක් ගෙවා තිබූ අතර එම ගෙවීම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සංරචක දෙකක් ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අමාත්‍ය මණ්ඩලයේ සහ ලෝක බැංකුවේ තීරණයක් මත පදනම් වී ඇත. කෙසේ වෙතත්, සංරචක දෙකම ඉතා සමීපව ක්‍රියාත්මක වනවා පමණක් නොව, සංරචක 01 හි ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සංරචක 02 හි මෙහෙයුම් කමිටු සාමාජිකයෙකු ලෙස මෑතක් වන තුරුම අඛණ්ඩව සේවය කරන ලදී. තවද, කෘෂි ව්‍යාපාර සමාගම් සමඟ සංරචක 02 යටතේ ක්‍රියාත්මක කරන ලද පොකුරු විසින් නැවත මිලදී ගැනීමේ ගිවිසුම් කිහිපයක් ඇති කර ගෙන ඇති අතර නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීම සඳහා සංරචක 01 මගින් සහාය වේ. | ජාතික ප්‍රතිපත්තියක් ලෙස, සංරචකය යටතේ ව්‍යාපෘතිය මගින් හඳුනාගෙන ඇති ප්‍රතිපත්තිවල විශ්ලේෂණාත්මක සහ ප්‍රතිපත්ති උපදේශන සහය සහ අවශ්‍ය ආධාරක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. |
| (ඇ) | ව්‍යාපෘතියේ සමාජ බලගැන්වීමේ තනතුර සඳහා බඳවා ගැනීමට ලංසු ලේඛනවල සඳහන් අවම සුදුසුකම් නොසලකමින් සහ එකවර අයදුම්පත් කැඳවීමකින් තොරව මධ්‍යම පළාත් කාර්යාලවලට මාසිකව රුපියල් 70,000 ක් ගෙවීමේ පදනම මත සේවකයෙකු වසර 02 ක් සඳහා බඳවාගෙන තිබුණි. එම අවුරුදු 02 සඳහා රු.1,680,000ක් ගෙවීමට ගිවිසුම්ගතවී තිබුණි. සේවා සපයන්නා විසින් ඉදිරිපත් කරන ලද සුදුසුකම්හි සත්‍යතාවය සහතික කර ගැනීමටද ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ.<br>සමාජ බලගැන්වීමේ තනතුර මිල කැඳවීමක් මගින් තෝරා ගන්නා ලද අතර හා ඔහු විසින් සපයා ඇති ලේඛනයන්හි නිරවද්‍යතාවය විශ්වාස කිරීමෙන් අදාළ පුද්ගලයා වෙත විෂයගත කාර්ය පිරිනමන ලදී. ඔහු ව්‍යාජ ලියවිලි ඉදිරිපත්කර ඇති බව දැනගත් විගස ඔහු සමඟ ඇතිකරගත් සේවා කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදී. මෙම තත්ත්වයෙන් පසු, ලංසු ලේඛන පරීක්ෂා කිරීමේදී සහ ඇගයීමේදී දැඩි සැලකිල්ලක් හා අවධානයක් දැක්වීමේ අවශ්‍යතාවය පිළිබඳව සියලුම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී ඇත. | ව්‍යාපෘතිය සඳහා සේවකයින් බඳවා ගැනීමේදී ඉදිරිපත් කරන ලද සහතිකයන්හි නිරවද්‍යතාවය තහවුරු කරගත යුතුය. |